(4) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෑම සාමාජිකයෙක් ම, ස්වකීය අත්සන තබා ජනාධිපතිවරයා වෙත යවන ලිපියක් මගින්, නියමිත දිනයට කලින් ඉල්ලා අස්වුවහොත් හෝ ජනාධිපතිවරයා විසින් හේතු දක්වා ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ මිස පත් කරනු ලැබූ දින සිට අවුරුදු පහක කාලයක් සිය ධුරය දරන්නේ ය. එහෙත් ඒ සෑම සාමාජිකයෙක් ම නැවත පත් කරනු ලැබීමට සුදුස්සෙක් වන්නේ ය.

(5) ජනාධිපතිවරයා විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කවර වූ හෝ සාමාජිකයකුට නිවාඩු දිය හැකි අතර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයකු වීමට සුදුසුකම් ඇති තැනැත්තකු ඒ නිවාඩු කාලය සඳහා තාවකාලික සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබිය හැක්කේ ය.

(6) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන්ට පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලබන වැටුප් ගෙවිය යුත්තේ ය. ඒ වැටුප් ඒකාබද්ධ අරමුදලට වැයබරක් වන්නේ ය. ඒ වැටුප් ඒ සාමාජිකයන්ගේ ධුර කාලය තුළ අඩු නොකළ යුත්තේ ය.

(7) රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ලේකම්වරයෙක් වන්නේ ය. ඒ ලේකම්වරයා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන්නේ ය.

(8) කොමිෂන් සභාවේ කවර වූ හෝ රැස්වීමක් සඳහා අවශ්‍ය ගණපූරණය තිදෙනකුගෙන් සමන්විත වන්නේ ය.

(9) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ යම් සාමාජික ධුරයක් හිස්ව තිබුණ ද කොමිෂන් සභාවට ක්‍රියා කිරීමට බලය ඇත්තේ ය. තව ද එවැනි යම් පුරප්පාඩුවක් හෝ යම් සාමාජිකයකු පත් කිරීමෙහි ලා යම් දෝෂයක් හෝ තිබූ පමණින් කොමිෂන් සභාවේ යම් ක්‍රියාවක් නැතහොත් කටයුත්තක් නිර්බල නොවන්නේ ය ; නිර්බල වන්නාක්සේ නොසැලකිය යුත්තේ ය.

(10) දණ්ඩ නීති සංග්‍රහයේ IX වන පරිච්ඡේදයේ කාර්ය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයකු රජයේ සේවකයකු ලෙස සැලකිය යුත්තේ ය.

57. (1) අමාත්‍ය මණ්ඩලය විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත විධානයක් කරමින් ඒ විධානයේ නිශ්චය කොට දක්වා ඇති යම් රජයේ නිලධර ගණ සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා, කොමිෂන් සභාවේ කමිටුවක් පත් කරන ලෙස රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිවරයාට විධාන කරන කවර අවස්ථාවක වුව ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් ඒ සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කමිටුවක් පත් කළ යුත්තේ ය. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කමිටු.

(2) මේ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාව යටතේ විධානයක් කරනු ලැබූ විට, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන් තිදෙනකුගෙන් සමන්විත කමිටුවක් පත් කළ යුත්තේ ය. රාජ්‍ය සේවා කොමිෂන්